සැලකිය යුතුයි :
+ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස - රචනා

1. a. සිතියමක සංරචක ලෙස භාවිතා කරනු ලබන සංකේත (symbols) පිළිබඳව සාකච්ඡා කරන්න.
   b. බද්ධ අසංගතය ඇතිවීම වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න.
   c. ජලයේ විවිධ පරාමිතීන් සඳහා උෂ්ණත්වයේ බලපෑම විග්‍රහ කරන්න.

2. a. ගුණාත්මක බ්‍රොයිලර් මස් නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර සඳහන් කරන්න.
   b. සිතියම් නිර්මාණයේ දී සුදුසු පරිමාණයක් තෝරාගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න.
   c. ආරක්ෂිත ගෘහයක් ඉදිකිරීමේ පළමු පියවර සුදුසු ස්ථානයක් තෝරා ගැනිමයි.මෙහිදී සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න.

3. a. තියොඩොලයිට්ටුව භාවිතයෙන් බිම් මැනීමේ ක්‍රමවේදය වැදගත්වන අවස්ථා පිළිබඳව සාකච්ඡා කරන්න.
   b. නෙලාගත් මත්ස්‍ය අස්වනු විවිධ අවස්ථා වලදී නිවැරදිව පරිහරණය කරන ආකාරයන් විස්තර කරන්න.
   c. ආහාර නිෂ්පාදන ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද මිශ්‍ර කෝඩියල් නිෂ්පාදයක් සඳහා GMP (යහපත් නිෂ්පාදන පිළිවෙත්) තත්ත්ව කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

4. a. ජෛව පද්ධති තුල පාංශු ජීවීන්ගේ වැදගත්කම සාකච්ඡා කරන්න.
   b. ගොවිපොළ සත්ත්ව පාලනයේදී උසස් තාක්ෂණික ක්‍රම යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
   c. ABC බිස්කට් සමාගම තම චොක්ලට් බිස්කට් නිෂ්පාදනය සඳහා 1980 අංක 26 දරන ආහාර පනතට අනුව ලේබලයක් සකසන ලදී. 1980 ආහාර ලේබල් පනතේ ප්‍රධාන නීති සඳහන් කර ඉහත නිෂ්පාදනය සඳහා ලේබලයක් නිර්මානය කරන්න. (නිෂ්පාදනයේ ආයුකාලය - මාස 06, බර 200 g, අඩංගු ද්‍රව්‍ය - රසකාරක, තිරිඟු පිටි, සීනි, ලුණු, මාගරින්)

5. a. පාංශු ව්‍යුහය ජෛව පද්ධති කෙරෙහි වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.
   b. විසිතුරු ජලජ පැලැටි වගාවේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න.
   c. හම්බන්තොට ප්‍රදේශයේ ගොවියෙකුගේ පුහුල් වගාවක අතිරික්තයක් ඇතිවී තිබේ. අතිරික්ත පුහුල් මගින් විවිධාංගීකරණය කරන ලද නිෂ්පාදනයක් සැකසීම සඳහා සුදුසු ගැලීම් සටහන දක්වා ඒ ඒ පියවරයන්හි වැදගත්කම විස්තර කරන්න.

6. a. සාම්ප්‍රදායික කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථානයක් වෙනුවට ස්වයංක්‍රිය කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථානයක් භාවිතයේ වාසි සඳහන් කරන්න.
   b. විශේෂිත තත්ත්ව යටතේ ආහාර ඇසුරුම් කරණයේදී යොදාගන්නා ඇසුරුම්කරණ තාක්ෂණ හා ඒවායේ වැදගත්කම විස්තර කරන්න.
   c. භූගත ජලය පුනරාරෝපණය වැඩි දියුණු කිරීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.